මානසික ආබාධ සහ මානසික ආබාධ සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් මෙන්ම මානසික ආබාධ සඳහා ප්‍රතිකාර ලබාගැනීම සම්බන්ධයෙන්ද අතීතයේ සිටම සමාජය තුළ පැවතුණේ ධනාත්මක ආකල්පයක් නොවේ. විශේෂයෙන්ම මානසික ආබාධ හැඳින්වීම සඳහා භාවිතා වූ ඇතැම් යෙදුම් ඔස්සේ ද එම අගතිකාරී හා කොන් කිරීමේ සමාජ ආකල්පය ප්‍රවර්ධනය විණි.

ඒ අනුව, "උන්මන්තක යාචකයා රක්වානම බියවද්දයි" යන සිරස්තලයෙන් අරුණ පුවත්පතේ (12/07) පළවූ පුවත් වාර්තාව විමසා බැලිය හැක. එහි පුවත් අන්තර්ගතයේ සඳහන් වන්නේ "මන්ද මානසික යාචකයෙකු" ලෙසිනි.

ඔබ සිතනා ලෙසට, "උන්මන්තක යාචකයා රක්වානම බියවද්දයි" වැනි සිරස්තල ඔස්සේ මානසික ආබාධ සහ මානසික ආබාධ සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් වන ඒකාකෘතික දැක්වීම් සහ කොන් කිරිම් ප්‍රවර්ධනය නොවන්නේ ද?

මූලාශ්‍ර:
https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC6198586/
https://www.journalisminaction.org/case/nellie-bly